# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 දෙසැම්බර් 31 | මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන | 2021 අංක 06**

## ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම

**1. නෛතික ප්‍රතිපාදන**

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම විධානය මුදල් මණ්ඩලය විසින් මෙමගින් නිකුත් කරනු ලැබේ.

**2. අරමුණු**

2.1 බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් හට එම බලපත්‍රලාභී මුදල් සමාගම නියමාකාරයෙන් සහ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි වන බව තහවුරු කිරීම.

2.2 බලපත්‍රලාභී මුදල් සමාගමක සිටින ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා විසින් සමාගමේ ස්ථාවරභාවයට මඟ පාදන බලපත්‍රලාභී මුදල් සමාගම්හි ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යෑම පිළිබඳ යහපාලන පරිචයන් ප්‍රවර්ධනය කරනු ඇත.

2.3 ඇල්මැති පාර්ශවකරුවන්ගේ යහපත වෙනුවෙන් කර්තව්‍යයන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් යෝග්‍යතාවය සහිත පුද්ගලයෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය.

**3. විෂය පථය සහ අදාළත්වය**

3.1 මෙම විධානයන් බලපත්‍රලාභී මුදල් සමාගම්වල සිටින සියලු ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ට අදාළ වේ.

3.2 බලපත්‍රලාභී මුදල් සමාගමක නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝජිත ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්, මෙම විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගමක නියම කරන ලද තනතුරට පත් කිරීම හෝ එම තනතුරේ කටයුතු කරගෙන යෑම සඳහා අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

3.3 7 වන විධානයට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් එම තනතුරේ අඛණ්ඩව කටයුතු කිරීමට ඇති යෝග්‍යතාවය වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

3.4 බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකුගේ ඕනෑම ඉල්ලා අස්වීමක්, විශ්‍රාම යෑමක් හෝ සේවයෙන් ඉවත් කිරීමක්, 8 වන විධානයට යටත් වේ.

**4. ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා**

4.1 බලපත්‍රලාභී මුදල් සමාගමකට සම්බන්ධ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා වන්නේ,

අ) බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක හෝ නොඑසේනම් සහ විකල්ප අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතුය).

ආ) බලපත්‍රලාභී මුදල් සමාගමක ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය.

i. ප්‍රධාන විධායක නිලධාරී

ii. අනුකූලතා නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ

නිලධාරී සහ සමාගම් ලේකම් ඇතුළු බලපත්‍රලාභී මුදල් සමාගම් සංවිධාන ව්‍යුහය මත ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ මට්ටමට පහළින් තිබෙන ආසන්නතම ස්ථර දෙක තුළ සිටින නිලධාරීන්. එවැනි නිලධාරීන් හට ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, යොමු කිරීම සහ පාලනය කිරීමේ අධිකාරය සහ වගකීම සතු විය යුතුය.

(ඇ) බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සිටින උපදේශකවරු හෝ අනුශාසකවරු සහ

(ඈ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ඇති පරිදි, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 'ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්'යන නිර්වචනයට ඇතුළත් වන වෙනත් ඕනෑම පුද්ගලයෙකු.

**5. යෝග්‍යතාවය තක්සේරු කිරීමේ නිර්ණායක**

5.1 ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝග්‍යතාවය පහත කරුණු වලට සීමා නොවෙමින් පහත නිර්ණායක යටතේ තක්සේරු කළ යුතුය.

**5.1.1 නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම**

**(අ) අවංකභාවය, ඒකාග්‍රතාව සහ කීර්තිය**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 21 වන වගන්තිය යටතේ දක්වා ඇති නිර්ණායක හෝ එහි සංශෝධන මත පදනම්ව තක්සේරු කළ යුතුය.

**(ආ) නිපුණතාවය සහ හැකියාව**

ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ නිපුණතාවය සහ හැකියාව තනතුරේ අවශ්‍යතාවන් සමඟ ගැළපිය යුතු අතර, පහත සාධක මත පදනම්ව තක්සේරු කළ යුතුය.

(i) බැංකුකරණය, මූල්‍යය, ව්‍යාපාර හෝ පරිපාලනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, විගණනය, මූල්‍ය විශ්ලේෂණය ආයෝජන කළමනාකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොල, තොරතුරු තාක්ෂණය, ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, අලෙවිකරණය අංශයන්හි ශාස්ත්‍රීය හෝ වෘත්තිමය සුදුසුකම් හෝ ඵලදායී අත්දැකීම් සහ නිශ්චිත සුදුසුකම් සහ බලපත්‍රලාභී මුදල් සමාගමේ අවශ්‍යතා වලට අනුව නිශ්චිත අත්දැකීම්

(ii) ව්‍යාපාරයේ තාක්ෂණික අවශ්‍යතා, ආවේණික අවදානම් සහ කළමනාකරණ ක්‍රියාවලිය හඳුනා ගැනීමට හැකියාව ලබා දෙන කුසලතා.

(iii) පෙර අධ්‍යක්ෂභාවය රැකියා හෝ කොන්ත්‍රාත් කාල සීමාව තුළ ආයතනය සාර්ථකත්වය කරා ගෙන යාම සඳහා දැක්වූ කාර්යසාධන මට්ටම සහ දායකත්වය.

**(ඇ) මූල්‍ය ස්ථාවරත්වය**

ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක ඕනෑම මූල්‍ය වගකීමක් සපුරාලීමට එවැනි පුද්ගලයෙකුට හැකි වේද යන වග මත තක්සේරු කළ යුතුය.

**(ඈ) සම්මත පසුබිම් පරීක්ෂා**

ණය කාර්යාංශය, නිර්දේශ පරීක්ෂා, වෘත්තීමය ආයතන, නියාමන බලධාරීන් සහ/හෝ වෙනත් ඕනෑම බලධාරියෙකු ඔස්සේ යෝග්‍ය පරිදි තක්සේරු කළ යුතුය.

**5.1.2 දැනට/අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්**

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී,

(i) 5.1.1 (ආ) (iii) වන විධානය හැරුණුකොට 5.1.1 වන විධානයෙහි දක්වා ඇති නිර්ණායක.

(ii) වර්තමාන අධ්‍යක්ෂභාවය හෝ රැකියාව තුළ ආයතනයේ සාර්ථකත්වය උදෙසා පවතින කාර්යසාධන සහ දායකත්ව මට්ටම.

(iii) නියාමන රාමුව සහ බලපත්‍රලාභී මුදල් සමාගමට නිශ්චිත මුදල් මණ්ඩල විධාන සමඟ පවතින බලපත්‍රලාභී මුදල් සමාගම් අනුකූලතා මට්ටම.

(ආ) වෙනත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(i) 5.1.1 (ආ) (iii) වන විධානය හැරුණු කොට 5.1.1 වන විධානයෙහි දක්වා ඇති නිර්ණායක.

(ii) වර්තමාන රැකියා හෝ කොන්ත්‍රාත් කාලය තුළ ආයතනයේ සාර්ථකත්වය උදෙසා පවතින කාර්යසාධන සහ දායකත්ව මට්ටම.

**6. අනුමත කිරීමේ ක්‍රියාවලිය සහ යෝග්‍යතාවය සඳහා පසුව සිදු කරන සංශෝධන**

6.1 බලපත්‍රලාභී මුදල් සමාගමේ සමාගම් ලේකම් විසින් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ඇමුණුම I අනුව අවශ්‍ය තොරතුරු සහ ලේඛන සහතික කර එළිදරව් නොවන ආවරණයක් මඟින් අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීම වගකීම වේ. සමාගම් ලේකම්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ඇමුණුම I අනුව අවශ්‍ය තොරතුරු සහ ලේඛන සහතික කර එළිදරව් නොවන ආවරණයක් මඟින් අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීම බලපත්‍රලාභී මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වේ.

6.2 අධ්‍යක්ෂවරයා විසින් 5.1 වන විධානය යටතේ නියම කොට ඇති නිර්ණායක මත පදනම්ව ඇමුණුම I ට අනුව යොමු කරන ලද තොරතුරු සහ ලේඛන තක්සේරු කළ යුතු අතර ඒ අනුව, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝජිත තෝරා පත් කිරීම, පත් කිරීම හෝ අඛණ්ඩව එම ධුරය දැරීම අනුමත හෝ ප්‍රතික්ෂේප කරමින් ලිපියක් නිකුත් කළ යුතුය.

6.3 උපදේශකවරයා හෝ අනුශාසකවරයා ආයතනයක් වන අවස්ථාවේ දී, යෝග්‍යතාවය තක්සේරු කිරීම පිළිබඳ නිර්ණායක බලපත්‍රලාභී මුදල් සමාගම වෙත උපදේශනමය අනුශාසකත්වය ලබා දීමෙහි නිරත වන ප්‍රධාන උපදේශකවරයා හෝ අනුශාසකවරයා සඳහා අදාළ විය යුතුය.

6.4 යෝග්‍යතා තක්සේරුව මත බලපෑමක් එල්ල කරනු ලබන සපයන ලද තොරතුරුවලට අදාළ සියලු පසුකාලීන සිදුවීම් පිළිබඳ හැකිතාක් ඉක්මනින් සමාගම් ලේකම් පූර්ණ වශයෙන් දැනුවත් කිරීමට ප්‍රධාන වගකිය යුතු පුද්ගලයන් විසින් කටයුතු කළ යුතුය.

6.5 බලපත්‍රලාභී මුදල් සමාගමේ සමාගම් ලේකම්වරයා විසින් යෝග්‍යතා තක්සේරුව මත බලපෑමක් ඇති කරනු ඇති ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා පිළිබඳ සපයන ලද තොරතුරුවලට අදාළව සියලු පසුකාලීන අවස්ථා සම්බන්ධව එවැනි තොරතුරු දැන ගැනීමට ලැබීමෙන් දින හතක් (7) ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු වේ.

6.6 බලපත්‍රලාභී මුදල් සමාගමක ඕනෑම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකුට අදාළව අධීක්ෂණයේදී ගැටලු හඳුනා ගත් ඕනෑම අවස්ථාවකදී අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන්නේ නම්, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සිදු කළ යුතුය.

**7. යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා කාල වකවානු**

7.1 **නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම**

අපේක්ෂිත තෝරා පත් කිරීමේ හෝ පත් කිරීමේ දිනයට වැඩ කරන දින විස්සකට (20) පෙර තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

7.2 **දැනට/අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්**

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී

අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට වැඩ කරන දින විස්සකට (20) පෙර හෝ අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ මුදල් වර්ෂයට පසු තෙමසක් ගත වන දිනය යන දින දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනයේ දී වාර්ෂික තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

(ආ) අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

රැකියා උසස් වීම්, කොන්ත්‍රාත් අලුත් කිරීම් සහ විශේෂ දැනුමක් සහ/හෝ නිපුණතා අවශ්‍ය තනතුරු වෙත සිදු කරන පාර්ශ්වීය චලන වෙනස්කම් මත වැඩ කරන දින විස්සකට (20) පෙර තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

**8. ඉල්ලා අස්වීම/විශ්‍රාම යාම/සේවයෙන් ඉවත් කිරීම**

8.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, බලපත්‍රලාභී මුදල් සමාගමෙන් ඉල්ලා අස්වීම, විශ්‍රාම යැම හෝ සේවයෙන් ඉවත් කිරීම සිදු නොකළ යුතුය. ඉල්ලා අස්වීම හෝ සේවයෙන් ඉවත් කිරීමේ අවස්ථාවක දී, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත ඊට හේතු යොමු කළ යුතුය.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**



8.2 අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී හැරුණු කොට බලපත්‍රලාභී මුදල් සමාගමේ වෙනත් ඕනෑම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ ඉල්ලා අස්වීම, විශ්‍රාම යෑම හෝ සේවයෙන් ඉවත් කිරීම සිදුවන අවස්ථාවේ සිට වැඩ කරන දින තුනක් (3) තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

**9. මුදල් මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම**

9.1 ඉහත 6.2 වන විධානය යටතේ නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අගතියට පත් පුද්ගලයෙකු බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් සිදු කරන ලද එම දැනුම් දීම ලැබීමෙන් වැඩ කරන දින දහයක් (10) ඇතුළත මුදල් මණ්ඩලය වෙත හේතු දක්වමින් සාධාරණාත්මක ආකාරයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

9.2 අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලද හේතු සහ අගතියට පත් පාර්ශ්වයේ විරුද්ධත්වයන් සලකා බැලීමෙන් අනතුරුව, අධ්‍යක්ෂවරයා විසින් සිදු කරන ලද ප්‍රතික්ෂේප කිරීම තහවුරු කරන්නේ ද යන්න හෝ ඊට ඔබ්බෙන් ක්‍රියා කරන්නේ ද යන්න තීරණය කිරීමට මුදල් මණ්ඩලය කටයුතු කරනු ඇත.

**10. බලාත්මක වන දිනය**

10.1 මෙම විධාන 2022.04.01 දින සිට බලාත්මක විය යුතුය.

**11. අර්ථ නිරූපණ**

11.1 ‘අධ්‍යක්ෂවරයා’ යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි “අධ්‍යක්ෂවරයා”, යන්න අදහස් විය යුතුය.

**12. විධාන අහෝසි කිරීම**

12.1 12.2 වන විධානයට යටත්ව, 2011 අංක 3 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය මෙම විධාන ක්‍රියාත්මක කිරීමේ දිනයේ සිට අහෝසි කෙරෙනු ඇත.

12.2 2011 අංක 3 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය යටතේ යෝග්‍ය බවට නිර්ණය කර ඇති, 4.1 වන විධානයෙහි සඳහන් බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් මෙම විධානයන් යටතේ යෝග්‍යතාවය තක්සේරුව කරන තෙක් සුදුසු සහ යෝග්‍ය බවට සැලකෙයි.

**නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

**ඇමුණුම I**

**ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහ ලේඛන**

**1. අවශ්‍ය තොරතුරු සහ ලේඛන**

1.1 **නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම**

(අ) විධානයන්හි දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව උපලේඛනය I ට අනුව සම්පූර්ණ කොට ඇති දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත.

(ආ) අදාළ ආයතනයේ පවරා ඇති රාජකාරීන්හි කාර්යසාධන මට්ටමට අදාළව පත්වීමට පෙර අධ්‍යක්ෂභාවය, රැකියාව හෝ කොන්ත්‍රාත් කාලය දැරූ සේවායෝජකයාගෙන් ලබාගත් ලිපියක්.

(ඇ) ඉහත කරුණුවලට අමතරව, බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත උපදේශකවරයෙකු හෝ අනුශාසකවරයෙකු පත් කිරීම සඳහා සාධාරණීකරණයක් සමග මණ්ඩල යෝජනා සම්මතයක්.

1.2 **දැනට/අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්**

1.2.1 **අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී**

| **අවශ්‍ය තොරතුරු සහ ලේඛන** | **සභාපති** | **අධ්‍යක්ෂ මණ්ඩලය** | **ප්‍රධාන විධායක නිලධාරී** |
|---|---|---|---|
| (අ) <u>දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත</u><br>විධානයන්හි දී ඇති මාර්ගෝපදේශවලට අනුකූලව සම්පූර්ණ කර දක්වා ඇති උපලේඛන අංක I අනුව | X | X | X |
| (ආ) <u>ස්වයං - තක්සේරුව</u><br>පසුගිය මාස 12 තුළ දී මූල්‍ය කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ඔහුගේ/ඇයගේ නායකත්වය යටතේ සිදු කර ගෙන යනු ලබන විශේෂ පැවරුම්/ව්‍යාපෘති සහ මුදල් සමාගමේ අගය ඉහළ නැංවීමට ඔහු/ ඇය සතු අනාගත සැලසුම් විස්තර යනාදී කරුණු ඇතුළත් කිරීම. | X | X | X |
| (ඇ) <u>සභාපතිගේ තක්සේරුව</u><br>පසුගිය මාස 12 තුළ දී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණ සමඟ දැක්වූ දායකත්වය සහ කාර්යසාධනය | - | X | X |
| (ඈ) අධ්‍යක්ෂ <u>මණ්ඩල යෝජනා සම්මතය</u><br>අධ්‍යක්ෂභාවය අඛණ්ඩව කර ගෙන යන, වයස අවුරුදු 70 ට වැඩි සහ උපරිම වයස අවුරුදු 75 වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් ඔස්සේ එවැනි අධ්‍යක්ෂ මණ්ඩලයක අධ්‍යක්ෂවරයෙකු/ අධ්‍යක්ෂවරයන් අඛණ්ඩව කටයුතු කිරීම මගින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත අත්වන ප්‍රතිලාභය ප්‍රමාණවත් ලෙස විස්තර කළ යුතු අතර, එය ලේඛන/සාක්ෂි මගින් හැකි සෑම අවස්ථාවක දී ම සනාථ කළ යුතුය. | - | X | - |
| (ඉ) <u>විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරු කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කාර්යසාධනය</u><br>සභාපතිවරයාගේ කාර්යසාධනය, විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් වාර්ෂික ස්වාධීන තක්සේරුව සිදු කිරීම | X | - | - |

### 1.2.2 වෙනත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(අ) <u>දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත</u>

විධානයන්හි දී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව සම්පූර්ණ කොට ඇති උපලේඛන අංක I.

(ආ) <u>ස්වයං-තක්සේරුව</u>

පසුගිය මාස 12 තුළ දී මූල්‍ය කාර්යසාධනය ඉහළ නැංවීම, ඔහුගේ/ඇයගේ නායකත්වය යටතේ සිදු කර ගෙන යනු ලැබූ විශේෂ පැවරුම්/ව්‍යාපෘති සහ මෙම මුදල් ආයතනයේ අගය ඉහළ නැංවීමට ඔහු/ඇය සතු අනාගත සැලසුම් විස්තර කිරීම යනාදී කරුණු.

(ඇ) උක්ත කරුණුවලට අමතරව, පසුගිය මාස 12 තුළ දී අත්කර ගත් ප්‍රධාන ජයග්‍රහණ සමඟ ලබා දුන් දායකත්වය සහ කාර්යසාධනය ආවරණය කරමින්, පහත තක්සේරු සිදු කිරීම අවශ්‍ය වේ.

(i) ප්‍රධාන විධායක නිලධාරියාගේ තක්සේරුව
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත උපදේශකවරයෙක් හෝ අනුශාසකවරයෙක්
- අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(ii) සභාපතිවරයාගේ තක්සේරුව
- අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වෙත උපදේශකවරයෙක් හෝ අනුශාසකවරයෙක්

## බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම දිවුරුම් ප්‍රකාශය

**I වන කොටසඃ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව යොමු කිරීමට නියමිත තොරතුරු**

| |
|---|
| **විදේශ ගමන් බලපත්‍රයේ ප්‍රමාණයේ ඡායාරූපය (පසු ගිය මාස 6 තුළ දී ලබා ගත්)** |

**බලපත්‍රලාභී මුදල් සමාගමේ නම:**

ජාතික හැඳුනුම්පත් අංක[1] ................................ දරන සහ විදේශ ගමන් බලපත්‍ර අංක............................ දරන ................................................................................................ යන ලිපිනයෙහි පදිංචි ................................................................................................ (සම්පූර්ණ නම) වන මා, [බෞද්ධ/හින්දු/මුස්ලිම්/ක්‍රිස්තියානි/කතෝලික/වෙනත් ............................. (කරුණාකර සුදුසු පරිදි නිශ්චිතව දක්වන්න)] ආගමිකයෙකු වශයෙන් [ගම්භීරතා පූර්වකව, අවංකව හා සත්‍ය ලෙස ද මින් ප්‍රතිඥා/දිවුරුම් දෙන අතර, (කරුණාකර නිශ්චිතව දක්වන්න)] පහත පරිදි ප්‍රකාශ කරමිඃ

1) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් වන ................. .......................................... (මුදල් සමාගමේ නම) හි ...................... (තනතුර) වශයෙන් නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට හෝ නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝජනා කර ඇති ඉහත නම සඳහන් සත්තකකරු/දිවුරුම්ප්‍රකාශක[2] මම වෙමි.

2) මගේ පෞද්ගලික තොරතුරු පහත පරිදි වන බවට මම ප්‍රකාශ කරමිඃ

| | | | |
|---|---|---|---|
| 2.1 | (i) මුලකුරු සමඟ නම: | | |
| | (ii) නාමය: මයා/ මිය/ මෙනවිය/ ආචාර්ය/ මහාචාර්ය/ වෙනත් (කරුණාකර නිශ්චිතව දක්වන්න) | | (iii) දිවුරුම් ප්‍රකාශය අත්සන් කරන දිනට වයස: අවුරුදු/මාස/දින |
| | (iv) උපන් දිනය: වර්ෂය/මාසය/දිනය | | (v) ස්ත්‍රී/පුරුෂභාවය: |
| | (vi) සිවිල් තත්ත්වය: | | (vii) ජාතිය: |
| | (viii) පුරවැසිභාවය[3] | | (ix) දේශීය/විදේශීය: |
| 2.2 | (i) ඇමතුම් විස්තර | ස්ථිර ලිපිනය: | |
| | | නේවාසික ලිපිනය: | |
| | (ii) දුරකථන අංක | ජංගම: | |

[1] විදේශිකයන් සඳහා අදාළ නොවේ.

[2] ප්‍රතිඥාවක් සිදු කරන පුද්ගලයෙකු ප්‍රකාශකයෙකු ලෙස හැඳින්වෙන අතර, දිවුරුම් දෙන පුද්ගලයෙකු දිවුරුම් සාක්ෂිකරුවෙකු ලෙස හැඳින්වේ. පුද්ගලයෙකුට දිවුරුම් දීමක් සිදු කිරීමට සවිඥානකව විරුද්ධත්වයක් ඇත්නම්, ඔහු දිවුරුම් දීම වෙනුවට, ප්‍රතිඥා දීමක් සිදු කරනු ඇත.

[3] ද්විත්ත්ව පුරුවැසියෙකු ඔහු/ ඇයව සැලකිය යුත්තේ දේශීය පුද්ගලයෙකු ලෙස ද, නැතහොත් විදේශිකයෙකු ලෙස ද යන්න සඳහන් කළ යුතුය

| | | | | |
|---|---|---|---|---|
| | | ස්ථාවර අංකය: | | |
| | | ෆැක්ස්: | | |
| | (iii) විද්‍යුත් තැපැල | විද්‍යුත් තැපැල - නිල: | | |
| | | විද්‍යුත් තැපැල - පෞද්ගලික: | | |
| 2.3 | රැකියාව හෝ වෘත්තිය: | | | |
| 2.4 | (i) නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම:<br>බලපත්‍රලාභී මුදල් සමාගමේ තනතුර/නිල නාමය: | | (i) තනතුර/නිල නාමය සඳහා පත් කළ දිනය: (වර්ෂය/මාසය/දිනය) | |
| 2.5 | පත්වීමේ ස්වභාවය [අදාළ කොටුව (කොටු) තුළ X ලකුණ සළකුණු කරන්න]: | | | |
| | ස්වාධීන[4] | | විධායක | |
| | ස්වාධීන නොවන | | විධායක නොවන | |
| | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | | වෛකල්පිත | |
| | වෙනත් (නිශ්චිතව දක්වන්න): | | | |
| | ස්වාධීන නොවන්නේ නම් ස්වාධීන නොවන ලෙස තීරණය කිරීමට හේතු: | | | |
| | ප්‍රධාන කොටස් හිමියා/හිමියන් විසින් නම් කරන ලද්දේ නම්, එලෙස නම් කරන ලද කොටස් හිමියා/හිමියන් ගේ නම/නම්: | | | |
| | වෛකල්පිත නම් ඔහුට/ඇයට අදාළ ප්‍රධාන අධ්‍යක්ෂවරයාගේ නම: | | | |
| 2.6 | (i) වාර්ෂික වේතනය ( විස්තරාත්මක තොරතුරු සහිතව): | | | |
| | (ii) ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා විසින් ලබා ගන්නා ආදායම්/ප්‍රතිලාභ වල වාර්ෂික වටිනාකම සහ එය බලපත්‍රලාභී මුදල් සමාගමට සාපේක්ෂ අගය: | | | |
| | (iii) බලපත්‍රලාභී මුදල් සමාගම සහ එම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ ඥාතීන් විසින් දරන වියදම හෝ වියදමක් ප්‍රතිපූර්ණය කිරීම (ණය පත් බිල්, උපයෝගීතා බිල් පත් යනාදිය): | | | |
| 2.7 | 2.7.1. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 74 වන වගන්තිය ප්‍රකාරව ඥාතීන් පිළිබඳ විස්තර | | | |
| | (i) භාර්යාව හෝ ස්වාමි පුරුෂයාගේ සම්පූර්ණ නම: | | | |

[4] මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව, 2021 අංක 05 දරන ආයතනික යහපාලන විධානය

| | | |
|---|---|---|
| | (ii) ජා.හැ.අංකය[1]: | ගමන් බලපත්‍ර අංකය: |
| | 2.7.2. යැපෙන දරුවන්ගේ විස්තර: | |

| සම්පූර්ණ නම | ජා.හැ.අංකය1 | ගමන් බලපත්‍ර අංකය |
|---|---|---|
| | | |
| | | |

3) පහත දක්වා ඇති අධ්‍යාපනික සහ/ හෝ වෘත්තීය සුදුසුකම/ සුදුසුකම් මා සතු බවට මම ප්‍රකාශ කරමි.

| සුදුසුකම් (අධ්‍යාපනික) | අදාළ විෂයය[5] | රට | ආයතනයේ නම | සම්පූර්ණ කළ වර්ෂය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| සුදුසුකම් (වෘත්තීමය) | | | | |
| | | | | |
| | | | | |

4) බැංකුකරණය, මූල්‍යය, ව්‍යාපාර හෝ පරිපාලනය හෝ වෙනත් අදාළ විෂයයක්5 මා සතු සඵලදායී අත්දැකීම පහත පරිදි බව මම ප්‍රකාශ කරමි:

| තනතුර | ආයතනයේ නම | නිල නාමය/ තනතුර | පත් කිරීමේ ස්වභාවය (අදාළ පරිදි) | කාර්ය විශේෂීකරණය | පත් කිරීමේ දිනය (වර්ෂය/ මාසය/දිනය) | සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය සිට වර්ෂය/ මාසය/දිනය දක්වා) |
|---|---|---|---|---|---|---|
| පෙර තනතුර | | | | | | |
| (i)අධ්‍යක්ෂ භාවය | | | | | | |
| (ii) වෙනත් | | | | | | |
| වර්තමාන තනතුර | | | | | | |
| (i)අධ්‍යක්ෂ භාවය | | | | | | |
| (ii) වෙනත් | | | | | | |

මේ හා සම්බන්ධව, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ලේඛනමය සාක්ෂි පවත්වා ගෙන යා යුතු අතර, අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වූ විට එවැනි සාක්ෂි යොමු කළ යුතුය.

5) ඉහත සඳහන් තොරතුරුවලට අමතරව, පහත දක්වා ඇති අමතර සුදුසුකම් මා සතු වග ප්‍රකාශ කර සිටිමි.

---

[5] බැංකුකරණය/ මූල්‍යය, ව්‍යාපාර/ පරිපාලනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය/ විගණනය/ මුදල් විශ්ලේෂණය, ආයෝජනය කළමනාකරණය/ ප්‍රාග්ධන වෙළඳපොල, තොරතුරු තාක්ෂණය, ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය සහ නියාමනය සහ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි විධිනියෝගයට අනුව අලෙවිකරණය සහ නිශ්චිත සුදුසුකම්

| විශේෂ පැවරුම්/ උපදේශක ධූරයන් | ආයතනයේ නම | විස්තරය | සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය) සිට (වර්ෂය/ මාසය/දිනය) දක්වා |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| කැපී පෙනෙන දායකත්වයන් (ප්‍රකාශන, පවත්වන ලද සම්මන්ත්‍රණ, පර්යේෂණ ආදිය) | | | |
| පර්යේෂණයේ/ ප්‍රකාශනයේ මාතෘකාව | | ආයතනය/ස්ථානය | වර්ෂය |
| | | | |
| | | | |

6) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත[6], හවුල්කාර[6] සහ අනෙකුත් සමාගම්[7]), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමග කොටස් හිමිකාරීත්වය දරන බව/ නොදරන බව ප්‍රකාශ කරමි.

| ආයතනයේ/ ආයතනයන්හි නම | ඡන්දය අයිතිය ඇති/නැති | කොටස් ප්‍රමාණය | | ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|
| | | සෘජු | වක්‍ර | සෘජු | වක්‍ර |
| | | | | | |

7) ව්‍යාපාර ගනුදෙනු

7.1. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) සහ වෙනත් සම්බන්ධිත පාර්ශව, බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමග පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

| ආයතනයේ/ ආයතනයන්හි නම | ගනුදෙනු වේ දිනය (වර්ෂය/ මාසය/දින ය) | වර්ෂය/මාසය/ දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.) | | වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය) | ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.) | බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | සීමාව | නොපියවූ ප්‍රමාණය | | | |
| **ලබාගත් ණය** | | | | | | |
| (i) වර්තමාන | | | | | | |

[6] 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව අනෙකුත් ආයතන සමග සැහෙන සබඳතාවක් පවතින ආයතන වේ.

[7] මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව වෙනත් සමාගම් කෙරෙහි සැලකිය යුතු උනන්දුවක් දක්වයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) පත්වීමට පෙර | | | | | |
| **ආයෝජන**[8] | | | | | |
| (i) වර්තමාන | | | | | |
| (ii) පත්වීමට පෙර | | | | | |
| **තැන්පතු** | | | | | |
| (i) වර්තමාන | | | | | |
| (ii) පත්වීමට පෙර | | | | | |

8) සමීප ඥාතීන්ගේ පත්වීම්, කොටස් හිමිකාරීත්වයන් සහ ව්‍යාපාර ගනුදෙනු

8.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස වර්තමානයේ තනතුරු දරන සමීප ඥාතීන්ගේ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

| සමීප ඥාතීයාගේ නම | ආයතනයේ නම | දරන තනතුර |
|---|---|---|
| | | |
| | | |

8.2 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ කිසියම් සමීප ඥාතියෙකු සෘජු හෝ වක්‍ර කොටස් හිමිකාරීත්වය පිළිබඳ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

| සමීප ඥාතීයාගේ නම | ආයතනයේ/ ආයතනයන්හි නම | කොටස් ප්‍රමාණය | | ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|
| | | සෘජු | වක්‍ර | සෘජු | වක්‍ර |
| | | | | | |
| | | | | | |

8.3 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු මාගේ සමීප ඥාතීන් තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

[8] ණය උපකරණවල ආයෝජන

| ආයතනයේ/ ආයතනයන්හි නම | ගනුදෙනුවේ දිනය (වර්ෂය/මාසය/දිනය) | වර්ෂය/මාසය/දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.) | | වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය) | ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.) | බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | සීමාව | නොපියවූ ප්‍රමාණය | | | |
| **ලබාගත් ණය** | | | | | | |
| | | | | | | |
| **ආයෝජන**[8] | | | | | | |
| | | | | | | |

9) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පොලිසියක, ඕනෑම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිමය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මගින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට හෝ ඒ හා සමාන අපරාධ කටයුත්තක් සම්බන්ධයෙන් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට මුහුණ දී සිටින බව/ මුහුණ දී නොසිටින බව ප්‍රකාශ කරමි.

10) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම අධිකරණයක, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මගින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට, නුසුදුසු හැසිරීමකට හෝ කිසියම් ව්‍යවස්ථාවකට හෝ රීතීන්ට, නියාමනයන්ට, විධානයන්ට හෝ නිර්ණායකයන්ට අනුකූල නොවීම ආදිය ඇතුළත් ඕනෑම ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීම සම්බන්ධයෙන් පාර්ශවකරුවෙකු වූ බවට වැරදිකරුවෙකු වී ඇති බව/ නොමැති බව ප්‍රකාශ කරමි.

11) මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද අපරාධයක් හෝ දුරාචාරය සම්බන්ධ කිසියම් වරදක් සිදු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක අධිකරණයක වරදකරුවෙකු වී ඇති බව/ වී නොමැති බව ප්‍රකාශ කරමි.

12) මා නිදහස නොලත් බුන්වත්කරුවෙකු වන/ නොවන බවත්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බංකොලොත් ලෙසින් ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

13) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක දී, ඕනෑම මූල්‍ය වගකීම් සපුරාලීමට මා හට හැකියාව ඇති/නැති බව ප්‍රකාශ කරමි.

14) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් අධිකරණයක් විසින් ලබා දෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් සම්පූර්ණ කිරීමට අසමත් වී ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

15) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් නිසි අධිකරණ බලතල හිමි අධිකරණයක් විසින් මානසික ගැටලුවක් ඇති ලෙස ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

16) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිළධාරී/ විධායක කාර්යයන් හි නියුතු නිළදාරියෙකු ලෙස කටයුතු කිරීම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් අත්හිටුවීම හෝ වළක්වා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

17) (i) බලපත්‍රය අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද; හෝ

(ii) ගණන් බේරා වසන ලද හෝ ගණන් බේරා වසා දැමීමට නියමිත හෝ අනිවාර්යෙන් ඈවර කරන ලද;

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිළධාරියෙකු හෝ වෙනත් ඕනෑම අධිකාරී තනතුරක් දරා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

18) මාගේ තනතුරට අදාළව මුදල් ව්‍යාපාර පනතේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ ප්‍රතිපාදනය පිළිබඳව මා දැනුවත් අතර, ඉහත තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය සහ සම්පූර්ණ බව තහවුරු කරමි. ඉහත ලබා දී ඇති තොරතුරු හා සම්බන්ධ සියලුම පසු සිදුවීම්, හැකි විගසින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දන්වා සිටීමට ප්‍රතිඥා දෙමි.

19) මා, ඉහත තනතුර සඳහා පත් කිරීම කිසිඳු ලිඛිත නීතියකින් නොවළක්වන බව ප්‍රකාශ කර සිටිමි.

20) මා, මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගමක ......................................... (තනතුර) සඳහා නම් කිරීමට,තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝග්‍ය පුද්ගලයෙකු බව මාගේ උපරිම දැනුමට අනුව ප්‍රකාශ කරමි.

මෙහි ඇතුළත් සියලු ප්‍රකාශයන් (සන්තකකරු/ප්‍රකාශක) හට කියවා දීමෙන් ද, ඒවායේ අන්තර්ගත කරුණු ඔහු/ඇය විසින් වටහා ගැනීමෙන් සහ ඒවා සත්‍ය බව පිළිගැනීමෙන් ද අනතුරුව ................................ (වර්ෂය,මාසය) ........................ දින දී ................................ හී දී අත්සන් තැබූ බව සහතික කරමි.

............................
*අදාළ පරිදි මුද්දර අලවන්න*

මා ඉදිරිපිට දී

...............................
...............
දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්වයකාර

**දෙවන කොටස - සමාගම් ලේකම් විසින් සම්පූර්ණ කළ යුතු වේ.**

**1. ආයතනික තොරතුරු**

| **අධ්‍යක්ෂවරුන් සඳහා නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ නිර්දේශය** | |
|---|---|
| **තක්සේරු කිරීමේ නිර්ණායක**<br>නාමයෝජනා කමිටුව/ පත් කිරීමේ අධිකාරිය විසින් සලකා බලන ලද විශේෂිත දැනුම/ කුසලතා සඳහන් කරන්න. | |
| **නිර්දේශ**<br>නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ සම්මත / තීරණය කිරීමේ වාර්තා අමුණන්න. | |

**2. අධ්‍යක්ෂ මණ්ඩලයේ සටහන්**

(i) ඉහත සඳහන් තොරතුරු සම්බන්ධයෙන් වෙනත් පැහැදිලි කිරීමක්/ තොරතුරු.

(ii) බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී/ ............................................ (වර්ෂය/මාසය/දිනය) දින පැවැත්වුණු රැස්වීමේ දී, ඉහත සඳහන් නම් කිරීම,තෝරා පත් කිරීම හෝ පත් කිරීම/යෝජිත නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

නම:

දිනය:

සමාගම් ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

**බලපත්‍රලාභී මුදල් සමාගම් හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින් විසින් යොමු කළ යුතු දිවුරුම් ප්‍රකාශය නිසි අයුරින් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින් විසින් යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් සහ නිවැරදි තොරතුරු ලබා දීම තහවුරු කිරීම සඳහා මෙම උපදෙස් මාලාව නිකුත් කරන ලදී.

**1. දිවුරුම් ප්‍රකාශය ලබා ගැනීමේ අරමුණ**

(i) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින්ගෙන් දිවුරුම් පෙත්සම් ලබා ගැනීමේ අරමුණ වනුයේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන ප්‍රකාරව ඔවුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම වේ. ඒ අනුව, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා සුදුසුකම්, අත්දැකීම්, අවංකභාවය සහ මුදල් ව්‍යාපාර පනතේ නිශ්චය කර ඇති අනෙකුත් අවශ්‍යතා සමග අනුකූල වීම පරීක්ෂා කිරීම සඳහා සවිස්තරාත්මක තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වේ. ගැටලුකාරී තත්ත්වයක දී මෙම දිවුරුම් ප්‍රකාශය නීත්‍යානුකූලව බලපැවැත්වෙන ලේඛනය වේ.

**2. දිවුරුම් ප්‍රකාශය**

(i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද ආකෘතිය අනුව නව ලේඛනයක් ලෙස දිවුරුම් ප්‍රකාශය සකස් කිරීම වඩාත් සුදුසු වන අතර එමගින් අනවශ්‍ය වචන ඇතුළත් කිරීම වළක්වා ගත හැක. කෙසේ වුවද, ලබා දී ඇති ආකෘතිය සම්පූර්ණ කළේ නම්, සියලු වෙනස්කම්, මකා දැමීම් සහ පේළි අතර ලිවීම් ආදිය එකී සංශෝධනයන් කළ සැනින්, දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(ii) සියලුම හිස්තැන් නිසි අයුරින් සම්පූර්ණ කළ යුතු වේ.

(iii) නිළධාරියාගේ ආගම අනුව සුදුසු වචන භාවිත කළ යුතු වේ. නිලධාරියා විසින් ඔහුගේ/ඇයගේ ආගම හෙළි කිරීමෙන් වැළකී සිටින්නේ නම්/ විරෝධය පාන්නේ නම්,

අ) ඔහු/ඇය අදේව දෘෂ්ටිකයෙකු බව හෝ දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් නොවන ආගමකට අයත් වන බව; හෝ

ආ) ඔහු/ඇය විසින් ආගම හෙළි කිරීමට විරෝධයක් දක්වන බව;

සඳහන් කරමින් අදාළ නිළධාරියා විසින් තහවුරු කිරීමක් යොමු කළ යුතු වේ.

(iv) අනවශය වචන(ය) කපා හරින්න. අනවශ්‍ය වචන කපා හැර ඇත්නම්, එවැනි සංශෝධනයක් කළ සැනින් දිවුරුම් කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(v) අදාළ පුද්ගලයා විදේශිකයෙකු සහ විදේශ රටක සිට දිවුරුම් ප්‍රකාශයට අත්සන් තැබුවේ නම්:

අ) ඔහු අත්සන තැබූ රටේ දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු හෝ ඒ හා සමාන බලතල හිමි තැනැත්තෙකු විසින් අදාළ පුද්ගලයාගේ අත්සන සහතික කළ යුතු වේ.

ආ) අදාළ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා වාසය කරන රටේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සියුලර් නිළධාරියෙකු ඉදිරිපිට දී හෝ එවැනි රටක ක්‍රියාත්මක වන නීතී ප්‍රකාරව සහතික කිරීම කළ යුතු වේ.

(vi) අදාළ වේ නම්, දිවුරුම් ප්‍රකාශය අත්සන් කරන දිනට අදාළ වටිනාකම අනුව මුද්දරයක් ඇලවිය යුතු වේ.

(vii) 'මා ඉදිරිපිට දී' අදාළ පුද්ගලයා අත්සන තැබූ සැනින් දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කළ යුතු වේ.

(viii) දෙවන කොටස සමාගම් ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතු අතර, අදාළ පත්වීම සම්බන්ධයෙන් නාමයෝජනා කමිටුවේ/ පත් කිරීමේ අධිකාරියේ යෝජනාවේ/ තීරණයේ පිටපතක් අමුණන්න.

(ix) දෙවන දෙවන කොටසේ 2(1) අයිතමය සඳහා දැක්වීමට අදහස් නොමැති නම්, එහි, අදාළ නැත/ නැත/ කිසිවක් නැත ලෙස සඳහන් කරන්න.